**බදුල්ල මහා නගර සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
---------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන
----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 05 දිනද ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2015 සැප්තැම්බර් 16 දිනද විගණනයට ඉදිරිපත් කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 සැප්තැම්බර් 28 දින මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා වෙත යවා ඇත.

### 1.2 මතය
------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට බදුල්ල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මූල්‍ය ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලටඅනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
--------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත දැක්වෙන අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ ඉඩම් 15 ක් සහ ගොඩනැගිලි 14 ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ සභාවට පරිත්‍යාග ලෙස ලැබී තිබූ මෝටර් රථ 03 ක වටිනාකම වූරු.33,077,813 ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කොට නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාලව ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.53,624 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.272,680 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු ආයෝජන වටිනාකම රු.120,428 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ මාස 07 කට අදාල ලැබිය යුතු මුද්දර ගාස්තු සහ උසාවි දඩ සඳහා ප්‍රතිපාදන සිදු නොකිරීමෙන් ආදායම අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ ආදායම රු.1,813,212 ක් අඩුවෙන් ගිණුම් තුළ දැක්වීමෙන් අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කඩ කුලී මත පනවන ලද 10% අධිභාර ගාස්තුව රු.381,854 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(එ) රු.142,500 ක් වන සේවක ණය ශේෂ 03 ක් අඩුවෙන් ගිණුම් තුළ දක්වා තිබුණි.

(ඒ) ඉකුත් වර්ෂය වෙනුවෙන් ප්‍රවර්තන වර්ෂයේ දී දරන ලද රු.615,507 ක් වටිනා වියදම් ප්‍රවර්තන වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයහිමියෝ රු.61,134,480 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයට අයත් ඉදිරි වර්ෂයේ දී ගෙවන ලද රු.389,177 ක් වූ වටිනා වියදම් සම්බන්ධයෙන් ණයහිමි ප්‍රතපාදන සිදුකර නොතිබුණි.

(ක) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සේවක ඇප තැන්පත් ආයෝජන ගිණුමේ ශේෂය සහ සේවක ඇප තැන්පත් ගිණුමේ ශේෂය රු.15,181 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ග) පුස්තකාල පොත් සමීක්ෂණ මඟින් ඉවත් කිරීමට නිර්දේශ කර තිබූ රු.307,338 ක් සඳහා මූල්‍ය ප්‍රකාශනවල ගැලපුම් කර නොතිබුණි.

(ඡ) සමාලෝචිත වර්ෂයේ දී ලද ඉකුත් වර්ෂයේ දෙසැම්බර් මාසයේ මන්ත්‍රී දීමනා ප්‍රතිපූර්ණ වටිනාකම වූ රු.315,000 ක් ප්‍රවර්තන වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ට) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේ මන්ත්‍රී දීමනා ප්‍රතිපූර්ණ වටිනාකම වූ රු.295,000 ක් වෙනුවෙන් ණයගැති ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඩ) සමාලෝචිත වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කිරීමේදී ගිණුම් තොරතුරු සැසඳිය හැකි ආකාරයට අවම වශයෙන් වර්ෂ දෙකක තොරතුරු මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 **නොසැසඳු පාලන ගිණුම්**

-------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු. 553,850,728 ක් වූ ගිණුම් විෂයයන් 23 කට අදාල ශේෂයන් සහ ඒවාට අදාල උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් රු.288,868,859 කින් නොසැසඳුණි.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 69,817,922 ක් වූ අතර, එදිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.129,423,985 ක් විය.

1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

රු. 57,539,496 ක් වටිනා ගිණුම් විෂයයන් 08 ක් සම්බන්ධයෙන් වූ වත්කම් ලේඛනය, ඉතුරුම් තැන්පතු, තොග ලේඛන, උප ලේඛන, අගරු වෙක්පත් හා සේවක ලිපිගොනු ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී සතුටුදායක ලෙස සත්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) මහා නගර සභා ආඥා පනතේ | |
| (i) 127(1) වන වගන්තිය සහ 42 වගන්තිය | සභාව 2011 සිට 2015 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ අනුමත කරන ලද ගොඩනැගිලි අයදුම්පත් 1075 න් අනුකූලතා සහතික 141 ක් පමණක් නිකුත් කර තිබූ අතර, බලය නොලත් ගොඩනැගිලි කඩා දැමීමට මහා නගර සභාවකට පැවරී ඇති බලතල ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) 218වගන්තිය | නගරාධිපතිවරයා විසින් එක් එක් මුදල් වර්ෂය තුළදී ඔහුගේ පරිපාලනය පිළිබඳ සවිස්තර වාර්තාවක් එම වර්ෂය තුළදී මහා නගර සභා අරමුදලට එකතු වූ ලැබීම් හා එම අරමුදල් වලින් ගෙවීම්වල ස්වභාවය හා ප්‍රමාණය දැක්වෙන ප්‍රකාශයක්ද සහිතව ඒ ඒ මුදල් වර්ෂය අවසන් වූ පසු පිළියෙල කර සභා සම්මත කර සති හයක් ඇතුළත අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ඉකුත් වර්ෂ 04 ක් සහ සමාලෝචිත වර්ෂයට අදාලව එසේ කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි | |
| මු.රෙ. 395 (ඇ) | සමාලෝචිත වර්ෂයේ බැංකු ගිණුම් දෙකකට අදාලව බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ 11.14 ඡේදය අනුව හා මු.රෙ. 102 | රජයේ නිලධාරීන් සඳහා ණය අත්තිකාරම් ලබාදී එම ලිපිගොනු මාණ්ඩලික නිලධාරියෙකු භාරයේ සේප්පුවක තැබිය යුතු වුවත්, මහා නගර සභාවේ රු.304,780 ක් වටිනා ණය ලිපිගොනු 12 ක් අස්ථානගත වී තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය<br>2009 සැප්තැම්බර් 01 දිනැති අංක DMA/2009/02 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනයක් හා පරිගණක උපාංග ලේඛනයක් නඩත්තු කරනොතිබුණි. |
| (ඉ) | 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | භාවිතයෙන් ඉවත් කර ඇති වාහන හා යන්ත්‍රෝපකරණ 20 ක් අපහරණයට කටයුතු කර නොතිබුණි. |
| (උ) | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ 2012 ජූලි 30 දිනැති අංක SEC 2012/03 දරන චක්‍රලේඛය | එකතු කිරීමේ අගය මත බදු ගණනය කිරීමේ දී ආයතනය විසින් ගෙවන ලද බදු සැලකිල්ලට නොගැනීමෙන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට රු.167,849 ක් වැඩිපුර ගෙවා තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,883,986 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.33,781,222 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

---------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 ජනවාරි 01 දිනට පැවති හිඟ වරිපනම් බදු, විනෝද බදු, කුලී ආදායම් හා සේවා ගාස්තු අයකර ගැනීමේ ප්‍රගතිය සියයට 34 දක්වා දුර්වල මට්ටමක පැවතුනි.

(ආ) මහා නගර සභා ආඥා පනතේ 261 වගන්තිය අනුව වරිපනම් බදු ගෙවීම් පැහැර හරින අවස්ථාවලදී චංචල දේපල තහනමට ගැනීම මඟින් හිඟ වරිපනම් බදු අයකිරීමට කටයුතු කළ යුතු වුවද, 2015 දෙසැම්බර් 31 දිනට වරිපනම් කොට්ඨාශ අංක 12 හි නියැදි පරීක්ෂාවේ දී කාර්තු 23 කට අධික කාලයක සිට හිඟ වරිපනම් ගාස්තු අය කර නොතිබුණි.

(ඇ) මහා නගර සභා ආඥා පනතේ 254(1) අනුව නගර සභාවට ලැබිය යුතු බදු, සියලුම ආදායම්, නාගරික කොමසාරිස් වරයා විසින් අයකර ගතයුතු වුවත්, 2015 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් රු.35,530,932 ක් අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) රාජ්‍ය ආයතන සමඟ නිසි සම්බන්ධීකරණයක් පවත්වා වරිපනම් බදු අදාල වර්ෂ තුළදී අයකර ගැනීමට කටයුතු නොකිරීමෙන් මහා නගර සභා බල ප්‍රදේශය තුළ පවතින රාජ්‍ය ආයතන රැසක අයවිය යුතු වරිපනම් බදු හිඟයක් පැවතුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පරිගණක මෘදුකාංග වාර්තා අනුව වරිපනම් බදු හිඟ ශේෂය හා පොදු ලෙජරය අනුව ශේෂය අතර රු.1,282,904 කින් නොසැසඳුණි.

(ඊ) 2008 මාර්තු 01 දින මිළදී ගත් පරිගණක මෘදුකාංගය සඳහා මේ දක්වා ගෙවා ඇති වාර්ෂික සේවා ගාස්තුව වර්ෂ 7 ක් සඳහා රු.490,000 ක් වුවත් ඒ සඳහා නගර සභාව විසින් ඵලදායීතාවයක් ලබාගැනීමට මෙහෙයවීම් සිදුකර නොතිබුණි.

(උ) නගර සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක වන ඉන්ධන පිරවුම්හලක් සඳහා 2015 වර්ෂය වෙනුවෙන් 2014 දෙසැම්බර් 26 දිනැති අංක 1895 දරන ගැසට් නිවේදනය ප්‍රකාර වෙළඳ බලපත්‍රය හා පරිසර බලපත්‍රය 2015 දෙසැම්බර් 31 දින දක්වා නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි.

.

(ඌ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි හෝටල්, ආපනශාලා හා නවාතැන් පොලවලින් පෙර වර්ෂයේ ලැබීම්වලින් 1% ක බලපත්‍ර ගාස්තුවක් අයකිරීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේ රු.5,000 ක මුදලකට වෙළඳ බලපත්‍ර නිකුත් කර තිබුණි.

(එ) 2015 වර්ෂයේ සිංහල, හින්දු අලුත් අවුරුදු සමය වෙනුවෙන් සේනානායක පිටිය පාරේ වෙළෙඳාම් කිරීමට භූමිය වෙන්කර දීමේ දී දිනකට රු.200 ක " පවිත්‍රතා ගාස්තුවක් " පමණක් අයකිරීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.490,446 ක ආදායමක් සභාවට අහිමිවී තිබුණි.

(ඒ) සේනානායක පිටිය තුළ දෛනිකව වෙළඳුන් 50 ක් පමණ ව්‍යාපාර කටයුතු කළද, එම පුද්ගලයින්ගෙන් බදු මුදල් අයකිරීමට හෝ අනවසර වෙළෙඳුන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඔ) නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා තිබුණු බදුල්ල තානායම 2014 මාර්තු 12 දින නැවත මහ නගර සභාව වෙත පවරාගෙන තිබුණද, 2015 දෙසැම්බර් 31 දින දක්වා ආදායම් උපයාගැනීමට කටයුතු නොකර නිෂ්කාර්යව පැවතුණි.

(ඕ) 2012 ජුනි සිට 2014 මාර්තු දක්වා තානායම් කළමනාකරණ ගාස්තු වශයෙන් සභාවට අයවිය යුතුඔ රු.2,975,280 ක මුදල 2015 දෙසැම්බර් 31 දින දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.2 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.1,557,767 ක මුදලක් සහ මුද්දර ගාස්තු රු.10,381,452 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

------------------------------------

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ xvi වන පරිච්ඡේදයේ 133 වගන්තිය ප්‍රකාරව රජයේ ආයතනවල පොලී ආදායම් රඳවාගැනීමේ බදුවලින් නිදහස් වුවද, මහ නගර සභාව සතු ස්ථාවර තැන්පත් ගිණුම් 04 කට අදාලව පොලී ගෙවීමේ දී බැංකුව විසින් රඳවාගෙන තිබූ රු.80,308 ක පොලී මුදල් නැවත සභාව වෙත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.2 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

--------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,883,710 ක් වටිනා අගරු චෙක්පත් සම්බන්ධයෙන් ශේෂ සනාථ සඳහා උපලේඛන ඉදිරිපත් නොවූ අතර, දීර්ඝ කාලයක සිට චෙක්පත් උපලබ්ධි නොවී අස්ථානගත වීමට අදාලව මුදල් රෙගුලාසි 189 හා 486 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

3.3 **ආර්ථික නොවූ ගනුදෙනු**

---------------------------

ආදායම් අයකිරීමකින් තොරව 2014 මාර්තු සිට 2015 ජූලි දක්වා බදුල්ල තානායම් විදුලිය ගාස්තු වෙනුවෙන් රු.82,229 ක් සභාව වැයකර තිබුණි.

4. **යහපාලනය හා ගිණුම් කටයුතු භාවය**

----------------------------------------

4.1 **අයවැය පාලනය**

-----------------

සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයෙහි ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

4.2 **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

--------------------------------

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4 වන පරිච්ඡේදයේ 4:2 අනුව සභාවේ මිලදී ගැනීම් හා ඉදිකිරීම් සම්බන්ධයෙන් වාර්ෂිකව ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දී එසේ කර නොතිබුණි.

4.3 **අභ්‍යන්තර විගණනය**

-----------------------

2015 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකොට නොතිබුණි.

4.4 **විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

--------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) ගබඩා පාලනය
(ඉ) වාහන පාලනය
(ඊ) ණයගැති සහ ණයහිමි පාලනය